# ICCP/SL/OP/075

## දෙමාපියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය දෙමාපිය දූදරු අන්තර් සබඳතා කෙරෙහි බලපා ඇති ආකාරය

තිසේරා පී.එන්.එස් [1*], දර්ශන ඒ.ටී.[2]

*1අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ශ්‍රී ලංකාව*
*2අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ශ්‍රී ලංකාව*
nilupnstissera@gmail.com

**පසුබිම** : ශක්තිමත් දෙමාපිය දූදරු අන්තර් සබඳතාව ධනාත්මක පෞරුෂයකින් හෙබි පුද්ගලයෙකු බිහි කරයි. සම්බන්ධතා ලිහිල් වීම කෙරෙහි විවිධාකාර සමාජීය මෙන් ම පෞද්ගලික හේතු කාරණා පාදක වන අතර එකී ශිථිලත්වය දරුවන්ගේ පෞරුෂ වර්ධනය කෙරෙහි බලපෑමක් ද සිදු කෙරෙයි. ඒ පිළිබඳ සාවධාන ව දෙමාපියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය දෙමාපිය දූදරු අන්තර් සබඳතා සඳහා බලපා ඇති ආකාරය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ අරමුණින් මත්ද්‍රව්‍ය භාවිත කරන දෙමාපියන් සිටින පවුල් ඒකක 10 ක් සිද්ධි අධ්‍යයන ක්‍රමය යටතේ විමර්ශනයට ලක් කරන ලදි.

**ක්‍රමවේදය** : ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ දරුවන්ට මාපිය මත්ද්‍රව්‍ය අනිසි භාවිතයේ බලපෑම අධ්‍යයනය කිරීමේ අරමුණින් සිද්ධි අධ්‍යයන ක්‍රමය යොදා ගනු ලැබිණි. සම්මුඛ සාකච්ඡා ඔස්සේ ලබාගත් ගුණාත්මක දත්ත ඒ ඒ ලාක්ෂණිකයන්ට අනුව තේමාත්මක අන්තර්ගත විශ්ලේෂණය යටතේ විමර්ශනාත්මකව ඉදිරිපත් කරන ලදි.

**ප්‍රතිඵලය** : මිනිසුන් අන්‍යයන් හා දක්වන ක්‍රියාවන් හා ප්‍රතික්‍රියාවන් ආදී සියල්ල ම සමාජ අන්තර් ක්‍රියා යනුවෙන් හඳුනාගත හැකිය. මේ අනුව සමාජ අන්තර් ක්‍රියා එක්තරා ක්‍රියාවලියකි. එම ක්‍රියාවලිය තුළ සමාජයේ සාමාජිකයෝ අන්‍යෝන්‍ය සමාජ සබඳතා පවත්වති. පවුල තුළ සාමාජිකයෝ ද අන්‍යෝන්‍ය සමාජ සබඳතා පවත්වමින් තම අවශ්‍යතා ඉටුකර ගැනීමට කටයුතු කරති. පවුල තුළ ඇති බැඳීම් මත දරුවන්ට මෙන් ම දෙමව්පියන්ගේ කාර්යයන්ට ද ඔවුනොවුන් අතර මැදිහත්වීම් ඇතිවේ. ළමා සංවර්ධනය සඳහා ආදරය, රැකවරණය, ආරක්ෂාව ඉතා වැදගත් සාධක වේ. ඒ අනුව කායික, මනෝ සමාජයීය, හා සදාචාර සංවර්ධනය උදෙසා දෙමාපිය දූදරු සබඳතාව කොතෙක් දුරට බලපා තිබේදැයි සොයා බැලූ මෙම පර්යේෂණය තුළ දී කරුණු රාශියක් අනාවරණය විය. මනෝ සමාජීය සංවර්ධනය පැත්තෙන් බැලූ කල, දෙමව්පියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය තුළින් පවුලේ සාමාජිකයින් පීඩනයන්ට පත් වී සිටි බව අනාවරණය විය. එම නිසා පවුල තුළ සාමාජිකයන්ට සුහද ව කටයුතු කිරීමට අපහසු වී ඇත. පවුලක් තුළ යහපත් පුද්ගල චර්යා සහ සිදු වීම් පවුලේ සුභ සිද්ධියට හේතු වන අතර අයහපත් පුද්ගල චර්යා පවුල තුළ ගැටලු නිර්මාණය කිරීමට හේතු වෙයි. මත්ද්‍රව්‍ය භාවිතය ද පවුල තුළ ආර්ථික තත්ත්වය කේන්ද්‍ර කොට ගත් විවිධ ගැටලු ඇති වීමට හේතු වන්නකි. මෙවැනි තත්ත්ව දරුවෙකුගේ කායික සංවර්ධනයට ද ඍජුව ම බලපා ඇති ආකාරය මෙම අධ්‍යයනය තුළ දී අනාවරණය විය. ආදරය, රැකවරණය පවුලක් තුළ අන්තර් සබඳතා වර්ධනය වන ප්‍රධාන ම සාධකයකි. පවුල තුළ සාමාජිකයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය යන සාධකය ඍජු ව මෙන් ම වක්‍ර ව බලපෑම් කර ඇති ආකාරය අධ්‍යයනය තුළ දී හඳුනා ගත හැකි විය. එහි දී පුද්ගල ගැටලු පවුල තුළට බලපෑම් ඇති කරන අතර එය සමාජ ගැටලු දක්වා වර්ධනය වීමක් හඳුනා ගත හැකිය. මේ නිසා පවුල තුළ අන්තර් සබඳතා බිඳ වැටීමත්, දරුවන් හා දෙමාපියන් අතර දුරස්ථභාවයක් වර්ධනය වීමත් සිදු වී ඇත. සදාචාරාත්මක වශයෙන් බැලූ කල, දරුවන් දෙමාපියන් ව නොසලකා හරින තත්ත්වයට පත් වී තිබේ.

**නිගමනය** : මෙසේ දෙමාපියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් පවුල තුළ ගැටලු ඇති වී තිබෙන අතර එය දරුවන්ගේ කායික, මනෝ සමාජයීය, හා සදාචාර සංවර්ධනය කෙරෙහි බලපෑමක් සිදු වී ඇති බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද** : දෙමාපිය දූදරු අන්තර් සබඳතා, පවුල, පෞරුෂ වර්ධනය, මත්ද්‍රව්‍ය භාවිතය, සමාජය